**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය - 2019**
**---------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
--------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් වියහැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාල නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාල වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශවීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුලදී කල් ඉකුත්වූ තැන්පතු රු. 2,602,716 ක් සමුච්චිත අතිරික්තයට ගැලපීමෙන් තොරව වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | කල් ඉකුත් වූ තැන්පතු ආදායමට ගැනීමේදී සමුච්චිත අතිරික්තයට ගැලපීම් කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබුණු රුපියල් මිලියන 10 ක් පුනරාවර්තන ප්‍රදාන ලෙස සලකා සමාලෝචිත වර්ෂයට අදාල විලම්භිත අදායම් (differed income) ලෙස ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් රු. මිලියන 15 ක් 2019 වර්ෂයේ ජූලි මාසයේදී ලබාදුන් අතර, එය ප්‍රාග්ධන සහ පුනරාවර්ථන ලෙස වර්ගීකරණයක් සිදුකොට නොමැත. එබැවින් තාක්ෂණ පීඨය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පුනරාවර්ථන වියදම් සඳහා ප්‍රමාණවත් මුදලක් පුනරාවර්ථන ප්‍රදාන ලෙස ගිණුම්ගත කරන ලදී. | ප්‍රාග්ධන හා පුනරාවර්ථන ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල අපහරණය කරන ලද කාර්යාල හා පරිගණක උපකරණ අයිතම 641 ක පිරිවැය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | වසර අග වෙන්දේසි කරන ලද ජංගම නොවන වත්කම් වල වටිනාකම් නිවැරදිව හඳුනාගත් වහාම ඒවා මූල්‍ය ප්‍රකාශවලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර වත්කම් අපහරණය කිරීමේදී නිවැරදි ලෙජර් ගිණුම්වල අදාල ගැලපීම් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

### 1.6.1 ගෙවිය යුතු ගිණුම්

-------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන එකතුව රු. 70,478,571 ක් වූ විවිධ ණය හිමි ශේෂ 10 ක් නිරවුල් කිරීමට 2019 දෙසැම්බර් වනවිටත් කටයුතු කර නොතිබුණි. | මෙම ණයහිමි ශේෂ අතරින් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු වෙත ගෙවිය යුතු රු. 920,883 ක් ඔවුන් විසින් ගොනුකර ඇති නඩු අවසන් වන තෙක් ගෙවිය නොහැක. ඉදිකිරීම් නිමකර ඇති ගොඩනැගිලි සඳහා අවසාන බිල්පත් ඉදිරිපත් කිරීමෙන් පසු ඉතිරි ණයහිමි ශේෂ පියවීමට කටයුතු කරනු ලැබේ. | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | 371(2) රෙගුලාසිය | 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා නිකුත් කරන ලද එකතුව රු. 7,260,421 ක් වූ පුනරාවර්තන අත්තිකාරම් 53 ක් හා එකතුව රු. 1,730,454 ක් වූ ප්‍රාග්ධන අත්තිකාරම් 15 ක් පියවීම සඳහා දින 30 සිට දින 270 දක්වා වූ කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි. | ඉදිරියේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 371(5) රෙගුලාසිය | අතුරු අග්‍රිම නිකුත් කරන ලද වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර පියවිය යුතු වුවත්, 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා | ඉදිරියේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අවස්ථා 60 කදී දෙන ලද ව්‍යාපෘති, පුනරාවර්තන සහ පර්යේෂණ අත්තිකාරම් රු. 10,075,944 ක් පියවීමට කටයුතු කර නොතිබුණි. | | |
| (iii) | මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | 2014 – 2017 කාලපරිච්ඡේදයට අදාල ටෙන්ඩර් තැන්පතු, රැඳවුම් මුදල්, ලංසු සුරක්ෂණ සහ කාර්යසාධන සුරක්ෂණ ඇතුලත් රු. 7,816,308 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු 184 ක් නියාදනය කර නොතිබුණි. | වසර 05 කට වඩා පැරණි වූ විට මුදල් රෙගුලාසි ප්‍රකාරව මුදල් කමිටුවේ සහ පාලක සභාවේ අනුමැතිය සහිතව නියාදනය කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | | | |
| (i) | V වැනි පරිච්ඡේදයේ 7.6 ඡේදය | 2000 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ නිළධාරීන් 12 දෙනෙකුගෙන් බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අයකරගත යුතු රු. 59,043,664 ක් 2020 ජුනි වනවිටත් අයකර ගෙන නොතිබුණි. නිළධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 38,872,629 ක් 216 වර්ෂයේ සිට කිසිදු වාරිකයක් අයකරලෙන නොතිබුණි. | නිලධාරීන් සිව් දෙනෙකුට වාරික මුදල් ගෙවන ලෙස සිහිකැඳවීම් ලිපි නිකුත් කර ඇති අතර, අනෙක් අය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග වලට අවතීර්ණ වී ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) | XX පරිජේදයේ 3.1 වගන්තිය | පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සනාථ කර ගැනීමකින් තොරව අධ්‍යයන කාර්යය මණ්ඩලයේ 334 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු. 952,484,696 ක් ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාලීය අධ්‍යයන කාර්යය මණ්ඩලය දිනපතා පැමිණීම හා පිටවීම සටහන් කිරීම සිදු නොකරන නමුත් ඔවුන් අදාල අධ්‍යයනාංශය මඟින් පවරා ඇති දේශන සඳහා සහභාගී වූ බවට “දේශන සඳහා පැමිණීම සටහන් කිරීමේ ලේඛන” මඟින් තහවුරු කරගෙන වැටුප් ගෙවා ඇත. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය හා අදාල චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ112 (1) වගන්තිය | විශ්වවිද්‍යාලයේ තත්කාලයෙහි ශිෂ්‍යයන්ව සිටින තැනැත්තන් ඇතුළත් කර තෝරාගනු ලබන ශිෂ්‍ය නියෝජිතයන්ගෙන් සමන්විත ශිෂ්‍ය සභාවක් පිහිටුවිය යුතු වුවත්, 2020 ජූනි වනවිටත් ශිෂ්‍ය සභාව ක්‍රියාකාරී තත්ත්වයට පත්කර නොතිබුණි. | මහා ශිෂ්‍ය සංගමයේ සංයුතිය සමන්විත වන්නේ පීඨ ශිෂ්‍ය සංගම්වල නියෝජිතයන්ගෙනි. එම සංයුතිය සම්පූර්ණ වී නොමැති බැවින් මෙම කටයුතු කල නොහැකි වී ඇත. | පනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛය | නිල නිවාස 237 ක පදිංචි කාර්යය මණ්ඩල සාමාජිකයින්ගෙන් අයකළ යුතු මූලික වැටුපෙන් සියයට 10 ක නේවාසික ගාස්තුව 2020 ජූනි වනවිටත් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අංක 33 වගන්තිය හා යථෝක්ත චක්‍රලේඛය අතර, නිලධාරියා යන්න නිර්වචනය කර ඇති ආකාරය වෙනස් බැවින් ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් උපදෙස් ලබා ගනිමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 02. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 85,813,285 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 60,546,285 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 25,267,000 ක පසුබෑමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන රු. 394,295,000 කින් වැඩිවී තිබුණද, සේවක පාරිශ්‍රමික හා ගිවිසුම්ගත සේවා රු. 405,526,348 කින් වැඩිවී තිබීම එම පසුබෑමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 හඳුනාගත් පාඩු

-----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය යටතේ කොන්ත්‍රාත් ආයතනයක් මඟින් පඹහින්න - කිංචිගුණේ මාර්ගයට ජලනල එලීමේදී සිදුකරන ලද කැනීම්වලදී විශ්වවිද්‍යාල පරිශ්‍රයේ සිට කෘෂිවිද්‍යා පීඨය සහ මුංගස්තැන්න ගොඩනැගිල්ල සඳහා අන්තර්ජාල සබඳතාවය සපයන ප්‍රකාශන තන්තු වලට සමාලෝචිත වර්ෂය තුල සිදු වී තිබූ හානි අළුත්වැඩියා කිරීම සඳහා ශ්‍රී ලංකා | ජලනල එලීමට කැණීම් කටයුතු කිරීමේදී හානි වී ඇති ප්‍රකාශ තන්තු අළුත්වැඩියා කර දෙන ලෙස අදාල කොන්ත්‍රාත් ආයතනයට විශ්වවිද්‍යාලය අවස්ථා කිහිපයකදී දැනුම් දී ඇත. කෙසේ වුවද, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | අළුත්වැඩියා කටයුතු ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

ටෙලිකොම් ආයතනයෙන් රු. 1,049,015 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. ප්‍රකාශ තන්තු අළුත්වැඩියා කරදෙන ලෙස අදාල කොන්ත්‍රාත් ආයතනය වෙත දැනුම් දී තිබුණද, 2020 ජූනි වනවිටත් අළුත්වැඩියා කර නොතිබීමෙන් කෘෂිවිද්‍යා පීඨයට අන්තර්ජාල සබඳතාවය නොමැති වී පීඨයේ කාර්යයන්ට බාධා වී තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෘදුකාංග භාවිතයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් සැකසීම හා දත්ත ඇතුලත් කිරීම සඳහා 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු. 1,368,300 ක් පෞද්ගලික සමාගමකට ගෙවා තිබුණ ද අදාල කාර්යය 2020 මැයි මාසය වනවිටත් ඉටු කර නොතිබුණි. | භාර දී තිබුණු මෘදුකාංගයේ මුද්‍රිත පරිගණකගත තොරතුරු සහ භෞතිකව පවතින වත්කම් නොගැළපෙන අවස්ථා වාර්තා වූයෙන් ගෙවීම් නතර කිරීම හේතුවෙන් අදාළ ආයතනය විසින් ඉදිරි කටයුතු සිදු කිරීමෙන් වැළකී සිටින ලදී. පරිගණකගත තොරතුරු පද්ධතිය මේ වනවිට ස්ථාපිත කර ඇති බැවින් අඩුපාඩු මගහැර ඉදිරි කටයුතු ඉටුකර ගැනීමට අවශ්‍ය විධිවිධාන යොදනු ලබන බව. | ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | පර්යේෂණ කාලසීමාව වර්ෂයක් වූ යෝජනා 10 ක් සඳහා 2016 හා 2017 වර්ෂ තුලදී පර්යේෂණ ප්‍රදාන ලෙස එකතුව රු. 11,795,667 ක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අවසන් පර්යේෂණ වාර්තා නිකුත් කර නොතිබුණි. එසේ තිබියදී එම නිලධාරීන් වෙත පර්යේෂණ දීමනා රු. 3,970,771 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද ගෙවා තිබුණි. | රට තුළ පැවති ව්‍යසනකාරී තත්ත්වය සැලකිල්ලට ගෙන නියමිත කාලසීමාව තුළ අවසන් කර නැති සියළුම පර්යේෂණ සඳහා 2020 දෙසැම්බර් 31 දක්වා කාල දිගුවක් ලබාදීමට 2020 ජූනි 09 දින රැස්වූ විශ්වවිද්‍යාල පර්යේෂණ කමිටුව තීරණය කර ඇත. | නියමිත කාලසීමාව තුළ පර්යේෂණ අවසන් කර වාර්තා නිකුත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යවහාරික විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයින් 30 දෙනෙකුට එකවර පුහුණු වියහැකි විද්‍යාගාරයක 2018 සැප්තැම්බර් 13 දින පිපිරීමක් සිදු වී තිබූ අතර, ඒ සම්බන්ධයෙන් පත්කළ විමර්ශන කමිටුව මගින් රු. 617,230 ක | විද්‍යාගාරයේ සිදු වූ පිපිරීමෙන් අනතුරුව සිදු කරන ලද පරීක්ෂණ අවසන් වන තෙක් ඉදිරි කටයුතු සිදුකළ නොහැකි විය. මේ වනවිට අළුත්වැඩියා කටයුතු තෝරාගත් | විද්‍යාගාරය පිළිසකර කර ශිෂ්‍යයින්ගේ ප්‍රායෝගික පුහුණුවීම් සඳහා පහසුකම් සැලසිය යුතුය. |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | අලාභයක් තක්සේරු කර තිබුණි. මෙම විද්‍යාගාරය 2020 අගෝස්තු දක්වාත් පිළිසකර කර යථා තත්ත්වයට පත්කර නොතිබුණි. | සමාගමකට පිරිනමා ඇත. | |
| (ආ) | 2007 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් විශ්වවිද්‍යාලය සඳහා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අනුමැතිය ලබා දී තිබුණු ඉඩම පවරා ගැනීම සම්බන්ධයෙන් ඇති වූ නීතිමය ගැටළුව මත රු. 1,494,543 ක මූලික වියදමක් දරා තිබිය දී ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු 2020 ජූනි වන විටත් ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. අනවසර පදිංචිකරුවකු විසින් ගොනු කරනු ලැබූ නඩුවේ තීන්දුව අනුව ඔහුට හිමිකමක් නොමැති බව තහවුරු වීමෙන් අනතුරුව, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව 2019 දෙසැම්බර් 10 දින රු. 1,010,000 ක වන්දි මුදලක් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා තිබුණි. තවද 2010 ජූලි 29 දින එකතුව රු. 30,448 ක වන්දි මුදල් හා පොළී ලබාගෙන තිබූ බලපත්‍රධාරියෙක් 2020 ජූනි වනවිටත් අදාල ඉඩමෙන් ඉවත් වී නොතිබුණි. | ඉඩම් පැවරීමට අදාල ඉදිරි කටයුතු කල යුත්තේ ඉඹුල්පේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගිනි. මේ දක්වා ඉඩමෙන් ඉවත් වී නොමැති බලපත්‍රධාරියා සම්බන්ධයෙන්ද නීතිමය කටයුතු කල යුත්තේ ඉඹුල්පේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් වේ. | ඉඩමේ අයිතිය නිරවුල් කරගෙන පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලයේ ලේකබාධිකාරී ධූරයේ කටයුතු කල නිලධාරියෙකුට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් 2014 වර්ෂයේ දී ආරම්භ කර තිබූ පරීක්ෂණය අවසන් වී නොතිබිය දී එම නිලධාරියා විශ්වවිද්‍යාල පාලක සභාවේ සාමාජිකයකු ලෙස 2018 අප්‍රේල් 20 දින සිට පත්කර තිබුණි. | මෙම නිළධාරියාගේ පත්වීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදුකර ඇති අතර එබඳු පත්වීමක් සම්බන්ධයෙන් මැදිහත් වීමක් කිරීමට විශ්වවිද්‍යාලයට හැකියාවක් නොමැත. | මේ පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය. |
| (ආ) | 2016 ජූනි මාසයේදී රු. 15,964,000 ක් වැයකර මිලදී ගෙන තිබූ “Desktop” පරිගණක යන්ත්‍ර 130 ක් නියමිත පිරිවිතරවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් 2018 පෙබරවාරි මාසයේ දී ත්‍රිපුද්ගල | කමිටු වාර්තාව ඉතා රහස්‍ය වාර්තාවක් බැවින් එය මුදල් අංශයට ලබා දීමට නොහැකි බවත් එය රහස්‍ය ආකාරයට පාලක සභාවට ඉදිරිපත් කරන ලද බවත් උපකුලපති වාචිකව සඳහන් කරන ලදී. එබැවින් | සියළු මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වියයුතු අතර, කමිටු වාර්තා ලැබී ඇති බවට |

| | | |
|---|---|---|
| පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණ ද අදාල පරීක්ෂණ වාර්තාව ලබා ගැනීමකින් තොරව එම මණ්ඩලය වෙත රු. 110,000 ක් ගෙවා තිබුණි. තවද එම පරිගණක පිරිවිතරවලට අනුකූල බවට සෑහීමකට පත්වීමකින් තොරව රු. 1,596,400 ක් වූ රඳවුම කොන්ත්‍රාත්කරු වෙත 2018 ජූනි 21 නිදහස් කර තිබුණි. | උපකුලපති විසින් අනුමත කරන ලද වවුචර්පත් සඳහා කමිටු සාමාජිකයින්ට ගෙවීම් කල අතර, 2018 ජූනි 21 දින රඳවා ගත් මුදල් ද ගෙවීමට කටයුතු කරන ලදී. | ලිඛිත තහවුරුවකින් තොරව කමිටු සාමාජිකයින්ට ගෙවීම් සිදු නොකළ යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩ වටිනාකම රු. 315,051,433 ක් වූ නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ I අදියර 2020 ජනවාරි 09 වනවිට අවසන් කළ යුතු වුවත්, 2020 පෙබරවාරි වනවිටත් භෞතික ප්‍රගතිය සියයට 20 ක් පමණ විය. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම හා කළ වැඩ වටිනාකම වශයෙන් රු. 83,010,286 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණද, ඉදිරිපත් කර තිබූ බිල්පත් අනුව කළ වැඩ වටිනාකම රු. 43,058,826 ක් වීමෙන් රු. 39,951,460 ක අතිරික්ත වටිනාකමක් කොන්ත්‍රාත්කරු සතුව තිබියදී, 2020 පෙබරවාරි සිට ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණි. 2020 පෙබරවාරි 07 දින අවසන් වී තිබුණු රු. 72,461,829 ක් වූ අත්තිකාරම් බැඳුම්කරය මුදල් කර ගැනිමට හෝ බැඳුම්කරයේ කාලසීමාව දිගුකර ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. | බැඳුම්කරයේ කාලසීමාව දිගු කරන ලෙස දන්වා අදාල ආයතනය වෙත වරින්වර ලිපි නිකුත් කර ඇති අතර, බැඳුම්කර මුදල විශ්වවිද්‍යාලයට ගෙවන ලෙස 2020 මාර්තු 03 දින බැංකුවට ලිඛිතව දන්වා ඇත. එහෙත් එම කරුණු ඉටු වී නොමැත. වැඩ ඉංජිනේරු විසින් 2019 ඔක්තෝබර් 28 දින පළමු වන බිල්පත වශයෙන් වැඩ වටිනාකම රු. 43,058,826 ක් නිර්දේශ කර ඇති නමුත් එම ආයතනය 2020 පෙබරවාරි 20 තෙක් ඉදිකිරීම් කල බැවින් වැඩ වටිනාකම ගණන් බලා ඉදිරිපත් කරන ලෙස වැඩ ඉංජිනේරු වෙත උපදෙස් දී තිබේ. මේ සම්බන්ධව පවතින අවසාන ගැටළු නිරාකරණය කර කඩිනමින් ගොඩනැගිල්ල ඉදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ගැටළු නිරාකරණය කරගෙන ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්යය මණ්ඩලයේ අනුමත තනතුරු 506 කින් තනතුරු 140 ක් ද අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ අනුමත තනතුරු 599 කින් තනතුරු 216 ක් ද පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු හේතුවෙන් | මේ වන විට පවතින පුරප්පාඩු පිරවීම සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් සහ පුවත්පත් දැන්වීම් මඟින් බඳවා ගැනීම්වලට අදාළ කටයුතු සිදු කරමින් ඇත. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය තුළ දී බාහිර කථිකාචාර්ය ගාස්තු ලෙස රු. 14,950,474 ක් ද නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා වශයෙන් රු. 31,095,467 ක් ද ගෙවීමට සිදුවී තිබුණි. | | |
| (ආ) | වර්ෂ 03 සිට වර්ෂ 20 දක්වා වූ කාලපරිච්ඡේදයක සිට සේවකයින් 08 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 386,513 ක් වූ ණය ශේෂ 13 ක් 2020 ජූනි වනවිටත් අයකර ගෙන නොතිබුණි. | සේවකයින් 06 දෙනෙකු සම්බන්ධව නීතිමය කටයුතු කෙරෙමින් පවතින අතර, අනෙක් දෙදෙනාගේ ණය ශේෂ ද අයකර ගැනීමට කටයුතු කරමින් ඇත. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 04. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වැය ශීර්ෂ 02 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉක්මවා රු. 275,581,000 ක් හා වැය ශීර්ෂ 03 ක පුනරාවර්තන ප්‍රතිපාදන ඉක්මවා රු. 107,459,807 ක් වැයකර තිබුණද, ඒ සඳහා සංශෝධිත අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | තාක්ෂණ පීඨය හා වෛද්‍ය පීඨය වෙනුවෙන් 2018 වර්ෂයේ අවසන් කාර්තුවේ හා 2019 වර්ෂයේ මුල් කාර්තුවේදී ලැබුණු මුදල් 2019 දී උපයෝජනය කළ බැවින් හා සේවක වැටුප් වැඩිවීම්, නව බඳවා ගැනීම් සහ නව පීඨ සඳහා ආරම්භක වියදම් දැරීමට සිදු වූ බැවින් ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවා වැය කිරීමට සිදු විය. | අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය. |

### 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය දැනුවත්වී තිබුණද, සිය විෂයය පථයට අනුව ළඟාකර ගතයුතු තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ හෙයින් ඒ හා සම්බන්ධ වන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟාවිය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය විසින් තිරසර සංවර්ධන අරමුණු 2030"න්‍යාය පත්‍රය" සම්බන්ධව අවධානය යොමුකර හඳුනාගත් ඉලක්ක 2018 හා 2019 වාර්ෂික වාර්තාවට ඇතුලත් කර ඇත. | තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ දිගුකාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 4.3 නොවිසඳී ඇති නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේදී රු. 123,052,693 ක් වැයකර ඉදිකර තිබුණු විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පිටිය සහ ක්‍රීඩාගාරයේ පැවති අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2017 අගෝස්තු 09 දින නියෝග කර තිබුණද, වටිනාකම රු. 5,156,160 ක් වූ රඳවා ගැනීමේ මුදල් භාවිතා කර ක්‍රීඩා පිටිය පිළිසකර කිරීමට 2020 ජූනි වන විටත් කටයුතු කර නොතිබුණි. | මෙම රඳවා ගැනීමේ මුදලින් පිට්ටනිය සකස්කර ගැනීමේ කටයුතු සඳහා උපදේශක සේවා ලබා ගැනීමට පියවර ගෙන ඇති අතර, එම කටයුතු 2020 වර්ෂයේ සිදු කිරිමට අපේක්ෂා කරනු ලැබේ. | ක්‍රීඩාපිටිය පිළිසකර කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල මුද්‍රණාලයේ ඇති ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රය 2016 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2020 ජූලි දක්වාම අක්‍රීය වී තිබීම නිසා මුද්‍රණාලය වසා දමා තිබුණි. එම හේතුවෙන් විශ්වවිද්‍යාලයේ මුද්‍රණ කටයුතු පුද්ගලික අංශයෙන් සිදුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ රු. 3,703,955 ක් වැයකර තිබුණි. | මෙම මුද්‍රණ යන්ත්‍රය ගැන විධිමත් තාක්ෂණ නිර්දේශ ලබා ගෙන අලුත්වැඩියා කිරීමේ ශක්‍යතාව විමර්ශනය කොට කඩිනමින් අවශ්‍ය පියවර ගැනීමට ක්‍රියා කරනු ලැබේ. | මුද්‍රණාලය ක්‍රියාකාරී තත්ත්වයට පත්කළ යුතුය. |